# මධ්‍යතන යුගයෙහි දාර්ශනික වැදගත්කම පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**කුඹුගොඩආරේ පඤ්ඤාලෝක හිමි**

දර්ශනයේ ආරම්භය කවදා කොතනකින් සිදු වූයේදැයි නිශ්චිතව කිව නොහැක්කකි. නමුත් මානව චින්තනය, තර්කණය, බුද්ධිමය සංකල්ප යනාදිය ආරම්භ වූදා සිටම මිනිස් සන්තානයේ දාර්ශනික සංකල්ප බිහිවන්නට ඇත. බටහිර දර්ශන ඉතිහාසය අධ්‍යයන පහසුව පිණිස ප්‍රධාන කොටස් 04 කට බෙදේ.

1. ග්‍රීක යුගය (Greek Ages)
2. මධ්‍යතන යුගය (Midvale Ages)
3. නූතන යුගය (Modern Ages)
4. සමකාලීන යුගය (Contemporary Ages)

මේ අතරින් ග්‍රීක, නුතන, සමකාලීන, යුග පිළිබඳව දර්ශනවාද විචාරකයන් තුළ ඇත්තේ සමාන්තර චින්තනයකි. විශ්වාසය මත පදනම්ව දේව ධර්මය හා දේවියන් වහන්සේගේ පැවැත්ම තහවුරු කිරීමට තත්කාලීන දාර්ශනිකයන් දැරූ උත්සාහය හේතුවෙන් මධ්‍යතන යුගය අඳුරු යුගය වශයෙන් ඉතිහාසයේ සටහන්ව ඇත (Roges, 1942, 307). ලෝකය තුළ ආගම් දර්ශන හෝ ඕනෑම විෂයයක් බිහිවීමේදී පූර්ව ඥානයන්හි බලපෑම නිරන්තරයෙන් සිදුවන්නකි. මධ්‍යතන යුගයේ ආරම්භයට ද එය පොදු ධර්මතාවයකි. සම්භාව්‍ය ග්‍රීක දාර්ශනිකයන් (Classical Greek philosophers) වූ ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් යන දෙදෙනාගේ ඉගැන්වීම් මධ්‍යතන යුගයේ දාර්ශනික ධාරාවන් පෝෂණය කළේය. ප්ලේටෝගේ ඉගැන්වීම් මත පදනම්ව ඇරඹි නව ප්ලේතෝනිකවාදය (New Platonicism) මධ්‍යතන යුගයේ ආරම්භයට පසුබිම සැකසීය. නව ප්ලේතෝනිකවාදයේ ආරම්භකයා ප්ලෝටිනස් (ක්‍රි.ව. 204 - 270) පෞරාණික යුගයේ ශ්‍රේෂ්ඨ දාර්ශනිකයන් අතරින් අවසානයා ය (රසල්, 1970: 314). ප්ලේටෝ ගේ ඉගැන්වීම් නව්‍ය දෘෂ්ටියකින් ඉදිරිපත් කිරීමට ඔහු දැරූ උත්සාහය ක්‍රිස්තියානි දර්ශනය

පෝෂණය කළේය. ඉංග් ඩීන්තුමා පැහැදිලි කරන ආකාරයට ක්‍රිස්තියානි ධර්මය සුණු විසුණු නොකොට ප්ලේටෝනිකවාදය, ක්‍රිස්තියානි ධර්මයෙන් කපා හෙළීම මුළුමනින්ම කළ නොහැක්කි. ක්‍රිස්තියානි ධර්මය දර්ශනික පදනමකින් විග්‍රහ කිරීමට ප්ලෝටිනස් දැමූ පදනම අමතක කළ නොහැක්කකි. ග්‍රීකයන් සිතුවම් කළ දෙවියන් වහන්සේ විටෙක ධර්මතාවයකි. විටෙක සංකල්පයකි. විටෙක පරමාදර්ශයකි. ප්ලෝටිනස්ගේ දේව විග්‍රහය ද දාර්ශනික පදනමක පිහිටා තිබූන ද එම විග්‍රහය ක්‍රිස්තියානි දර්ශනයේ බිහිවූ දෙවියන් වහන්සේට මාර්ගය හෙළි කළේය. මධ්‍යතන යුගයේ දෙවියන් වහන්සේ ජීවමාන ය. සර්වතෝභද්‍ර සර්වඥ ද වේ. ප්ලෝටිනස්ගෙන් පසුව ක්‍රමයෙන් ග්‍රීක ඥානය බිඳ වැටුණු අතර රෝමයේ අධිරාජයකු වූ ජස්ටියානු අධිරාජයා ක්‍රි.ව. 529 දී ග්‍රීක විද්‍යායතන විසුරුවා හැරීම ග්‍රීක ඥානයේ දෙදරා යාමට වැඩි බලපෑමක් කළේය. එය දර්ශනයේ කාර්යය, ස්වභාවය, මෙන්ම විෂය ක්ෂේත්‍රය ද වෙනත් මගකට යොමු කළේය. (කලංසූරිය, 2002, 41). බර්ට්‍රන්ඩ් රසල් විග්‍රහ කරන ආකාරයට ප්ලෝටිනස් ආරම්භයක් මෙන්ම අවසානයක් ද විය. එනම් ග්‍රීක දර්ශනයේ අවසානය හා ක්‍රිස්තියානි දර්ශනයේ ආරම්භයයි.

මධ්‍යතන යුගය හැඳින්වීම සඳහා භාවිත නම් කිහිපයකි. ක්‍රිස්තියානි දර්ශනය, කතෝලික දර්ශනය, දේව දර්ශනය, අඳුරු යුගය, යනාදී නම් ඒ අතර ප්‍රමුඛ වේ. මධ්‍යතන යුගය විෂය ක්ෂේත්‍රය අතින් ග්‍රීක යුගයෙන් වෙනස් වේ. දෙවියන් පිළිබඳ ඇති විසංවාදී බව ප්‍රමුඛ නිදසුනකි. ක්‍රි.ව. 400 - 1400 අතර කාලය මධ්‍යතන යුගය ලෙස හඳුනා ගැනේ (රසල්, 1970, 331). රසල් මධ්‍යතන යුගයේ මූලික බෙදීම් දෙකක් විග්‍රහ කරයි.

1. ශුද්ධ අගොස්තීනු යුගය
2. ශුද්ධ තෝමස් ඇක්වයිනාස් යුගය

පළමු යුගයේ ප්ලෝටිනස්ගේ හා ප්ලේටෝගේ ඉගැන්වීම් ප්‍රමුඛ විය. ඇරිස්ටෝටල්ගේ ඉගැන්වීම් දෙවන යුගයේ ප්‍රමුඛ විය. දෙවියන් වහන්සේගේ පුරය (City of God) ආරක්ෂා කර ගැනීම ක්‍රිස්තියානි සභාවේ මූලික අරමුණ විය. දේවධර්මයේ සප්‍රමානතා නොපිළිගත් අයට පිළිතුරු දීමට තර්කය මූලික මාර්ගයක් ලෙස යොදා ගැනුණි. තර්කයේ

සරණ පැතීම දර්ශන ඉතිහාසය පුරාවට සාර්ථක නොවුන ද මධ්‍යතන යුගය තම මූලික අරමුණ වන දෙවියන් වහන්සේගේ පැවැත්ම තහවුරු කිරීම සඳහා තර්කය යොදාගත්හ. මෙම යුගය සංකල්පීය වශයෙන් ශක්තිමක් කළ ක්‍රිස්තියානි සභාවේ විශාරදයෝ තිදෙනෙකි. (රසල්, 1970, 366 ච) එනම් ශුද්ධ ඇම්බෝස් ශුද්ධ ජෙරොම් ශුද්ධ අගොස්තීනු යන තිදෙනා යි. ඔවුන් තිදෙනා තරම් ම වැදගත් වන ගෙගරි පාප්තුමා පශ්චාත්කාලීන වන අතර මුල් තිදෙනා සමකාලිනයෝ වූහ. අධ්‍යයන පහසුව පිණිස මධ්‍යතන යුගය කොටස් වශයෙන් තුනක් යටතේ විස්තර කරයි.

01. මුල් කාලීන මධ්‍යතන යුගය (ක්‍රිːවː 476 - 1000)

02. මධ්‍යකාලින මධ්‍යතන යුගය (ක්‍රිːවː 1000 - 1300)

03. පසුකාලීන මධ්‍යතන යුගය (ක්‍රිːවː 1300 - 1600)

ෆෙඩ් රොබින්සන් නම් දාර්ශනික විශාරදයාගේ පැහැදිලි කිරීමට අනුව මෙම යුගය ට මධ්‍යතන යුගය ලෙස භාවිත කළ පළමු ලියවිල්ල අපට හමුවන්නේ 1469 දී ය. එහි සඳහන්ව ඇත්තේ ''Media Tempestas'' යනුවෙනි. මෙම වචනාර්ථ විග්‍රහට අනුව රෝමානු කතෝලික දහම ප්‍රචලිතව පැවති ලතින් බස හැසිර වූ රෝම අධිරාජ්‍යයේ බටහිරි භාගයෙහි සමාජ ආර්ථික තොරතුරු අනාවරණය වේ. මධ්‍යතන දර්ශනයේ භූගෝලීය සීමා ලෙස බටහිර (ලතින්) යුරෝපයත්, පෙරදිග (ග්‍රීක) යුරෝපයත්, උතුරු අප්‍රිකාවත්, සුළු ආසියාවේ (Asia Minor) යම් ප්‍රදේශත් දැක්විය හැක. (සුමේධ සහ විජේසුන්දර, 2011, 137)

### මධ්‍යතන යුගයේ දාර්ශනික ප්‍රවාහ

උක්ත මාතෘකාව පිලිබඳ සාමාන්‍ය වශයෙන් කෙරෙන සාකච්ඡාව අපි කාටත් හුරු වූවකි. දර්ශනයේ අඳුරු යුගය යන යෙදුමෙන් ම මධ්‍යතන දාර්ශනික ප්‍රවාහ පිළිබඳ මතවාදය ප්‍රකට වෙයි. බොහෝ විචාරකයන් මෙම යුගය පිළිබඳ කරුණු දක්වා ඇත්තේ දාර්ශනික චින්තය තුළ ඉතාමත් දුර්වල යුගයක් වශයෙනි. මුලදි ක්‍රිස්තු ධර්මයෙහි කිසියම් දර්ශයක් නොවී ය. නමුත් පසුව ඔවුන්ගේ අනුග ාමිකයන් අතර ග්‍රීක හා රෝමන් ලේ මිශ්‍රවීම නිසා දාර්ශනික බුද්ධිය උදාවිය. (පඤ්ඤාකිත්ති, 2003, 8). මෙම යුගයට අඳුරු යුගය යන්නට

භාවිත කිරීමට බලපෑ සාධක මූලික වශයෙන් ම අධ්‍යයනය කළ යුතු ය. පෙරදිග දර්ශනය ආගමික චින්තාවන් මූලික කර ගනිමින් ගොඩ නැගුනකි. විශේෂයෙන් භාරතීය දර්ශනවාද සියල්ලක් ම පාහේ ආගමික චින්තාවන් ම බව පැවසීම වරදක් නොවේ. නමුත් බටහිර දර්ශනවාදය ක්‍රිස්තියානි ආගමික චින්තාවන්ගේ එක්වීම අඳුරක් ලෙස දැකීම විමර්ශනාත්මක ව හා අපක්ෂපාතීව විමසා බැලිය යුත්තකි. මධ්‍යතන දාර්ශනිකයන් සිදු කළේ ග්‍රීක ඥාන සම්ප්‍රදාය අනුගමනය කරමින් ක්‍රිස්තියානි දර්ශනය දියුණු කිරීමයි. වසර දහසක පමණ කාලයක් එම දර්ශනවාදය පැවතීමට හැකි වුණි. ක්‍රිස්තියානි ඉගැන්වීම්වලට අභියෝග කළ හැකි ඉගැන්වීම් ඇති වූයේ නම් මධ්‍යතන යුගය ඉතා ඉක්මනින් බිඳවැටෙනු ඇත. එසේ ම ක්‍රිස්තියානි දර්ශනයට විරුද්ධ මතවාදයන් විනාශ කොට දැමීම ක්‍රිස්තියානි සභාව සිදු කළ වරදකි.දෙවියන් පිළිබඳ දැඩි ආදාහනග්‍රාහී (Dogmatism) බවක් මෙකල දක්නට ලැබුනි. මධ්‍යතන යුරෝපීය සමයේ දී සහ පුරුත්ථානය ඇරඹි ශතවර්ෂයන්හි ලක්ෂ සංඛ්‍යාත ජනකායක් කතෝලික පල්ලියේ සත්‍ය අවිශ්වාස කිරීම නිසා හෝ ප්‍රශ්න කිරීම නිසා හෝ පුළුස්සා මරණ ලද බව මනුස්ස ඉතිහාසය නිහඬව පවස යි. බෲනෝ (ක්‍රිːවː 1548 - 1600) නැමැති දාර්ශනිකයා පල්ලියට විරුද්ධව අදහස් ප්‍රකාශ කර හෙයින් පුළුස්සා මරා දමන ලදී. එසේ ම කොපනිකස් (ක්‍රිːවː 1473 - 1543) ගේ විප්ලවීය උපන්‍යාසය වන පෘතුවිය සූර්යයා වටා භ්‍රමණය වන්නේය ය පැවසීම හේතුවෙන් වර්ෂ 1616 දි එම ඉගැන්වීම කතෝලික පල්ලිය විසින් තහනම් කෙරුණි. ගැලීලියෝ ගැලලිට (ක්‍රිːවː 1564 - 1642) තමාගේ තීක්ෂණ බුද්ධියට අනුව නිදහසේ සිතීමට ඉඩ නොදුණි. කොපනිකස්ගේ වාදය නො ඉගැන්වීමට බලයෙන් දිවුරන ලද බව පෙනේ (Mayer, 1951, 25). ඉහත සාකච්ඡාව අනුව පල්ලිය විසින් මධ්‍යතන යුගයේ ඥානය තම අධිපත්‍ය මත පමණක් පවත්නාගැනීමට දැරූ උත්සාහය ප්‍රකට වෙයි. මේ සඳහා තත්කාලීන දේශපාලන බල අධිකාරියේ සහය ද කතෝලික සභාව සඳහා ලැබුණි. වසර දහසක් පමණ යනතුරු ක්‍රිස්තියානි දර්ශනය පවත්වාගැනීමේ ගෞරවය පල්ලිය විසින් නැති කර ගනු ලැබුවේ ප්‍රතිවාදී මතවලට මර්දනීය ප්‍රතිචාර දැක්වීම හේතුවෙනි. එම හේතුවෙන් දෙවියන් හා කිතු දහම බුද්ධිමය හා දාර්ශනික පදනමකින් විග්‍රහ කිරීමට ඔවුන් දැරූ උත්සාහයෙහි අගය ද අඳුරින් වැසී ගියේ ය. මධ්‍යතන දර්ශනයෙහි මූලික අරමුණ

දෙවියන් වහන්සේගේ පැවැත්ම තහවුරු කිරීමයි. දෙවියන් තහවුරු කිරීමට මධ්‍යතන යුගයෙහි ඉදිරිපත් කළ මූලික තර්ක තුනකි.

01. මූල හේතුක තර්කය (First Cause Argument)

02. සත්භාව තර්කය (Ontological Argument)

03. සාධ්‍යතා තර්කය (Teleological Argument)

දෙවියන්ගේ පැවැත්ම තහවුරු කිරීමට ඉදිරිපත් වූ තර්ක අතුරින් මූල හේතුක තර්කය ප්‍රධාන වූවකි. පෙරදිග දර්ශනයේ අපට හමුවන මහාබ්‍රහ්මන් ආදි සංකල්ප දියුණු වන්නේ ද මූල හේතුක ඉගැන්වීම් මුල් කර ගනිමිනි. ලෝකයේ සෑම දෙයක් සඳහා ම මුල් වූ හේතුවක් ඇත. විශ්වයේ මූල හේතු ව සර්වබලධාරී දෙවියන් වහන්සේය යන නිගමනය මත මෙම තර්කය ගොඩ නැගී ඇත. ශාන්ත තෝමස් ඇක්වයිනාස් පියතුමා දෙවියන්ගේ පැවැත්ම තහවුරු කිරීමට බලවත් උත්සාහයක් දැරූ මධ්‍යතන යුගයේ චින්තකයෙකි (ධර්මසිරි, 2007, 109). මූල හේතුක තර්කය සඳහා ප්ලේටෝගේ සහ ඇරිස්ටෝටල්ගේ ඉගැන්වීම් බලපා ඇත. ප්ලේටෝගේ පැහැදිලි කිරීමට අනුව ලොව ඕනෑම ද්‍රව්‍ය, වස්තු හා ජීවයට අදාල ගති ඇත. තිරිසනුන්ට ආත්මයක් නොමැත. ගස් වැල්වලට ස්වයං නිෂ්පාදන ශක්තියක් නොමැත. නමුත් තිරිසනුන් ගමන් කරයි. ගස්වැල් එල දරයි. මේ සියල්ල සඳහා බලපානු හේතු දෙවින්යන් වහන්සේ ය. ප්පේටෝගේ ආකෘතික හා ප්‍රපඤ්ච ලෝක (Formal and Fictional Worlds) සංකල්පය ද එක්තරා ආකාරයකට මධ්‍යතන යුගයේ දේව සංකල්පය සඳහා බලපෑම් සිදු කළේ ය. නොවෙනස් ශුද්ධ ආකෘතියක් සහිත සාමාන්‍ය මිනිසාට නොපෙනෙන ලොවක් ඇත. ප්‍රපඤ්ච ලෝකයේ ඇති සියල්ලෙහි ශුද්ධ හා මූලික ආකෘති එම ලෝකයෙහි පවතී. ප්‍රපඤ්ච ලෝකයේ විශ්වය ද්‍රව්‍ය ජීවය වෙනස් වුව ද ඒ සියල්ලෙහි මූල ආකෘතිය ආකෘතික ලෝකය තුළ නොවවෙනස් ව පවති යන්න ප්ලේටෝගේ අදහස යි. මූල හේතු තර්කය යම් පමණකට පෝෂණය කිරීමට මෙම ඉගැන්වීම් බලපෑම් ඇති කළේ ය. ඇරිස්ටෝටල්ගේ හේතුඵල ඉගැන්වීම් ද මූල හේතුක තර්ක පෝෂණය කළේ ය. ඔහුගේ අචල චාලකයා (Unmoved mover) සංකල්පය දෙවියන් පිළිබඳ තර්කය පෝෂණය කිරිම සඳහා විශාල බලපෑමක් සිදු කළේ ය. සියල්ල වෙනස්වන ලෝකය තුළ නොවෙනස් අචාලකයෙකු පිළිබඳ සංකල්පය ඇරිස්ටෝටල් තම දර්ශනයෙන්

ඉස්මතු කරයි. එසේ ම ඔහුගේ ඉගැන්වීම් අතර එන ශක්‍යතාවය හා තත්‍යතාවය (Feasibility and feasibility) පිළිබඳ ඉගැන්වීම ද වැදගත් වූවකි. දොඩම් ඇටයකින් දොඩම් ගසක් ඇති වේ. දොඩම් ගසක් ඇතිවීමේ ශක්‍යතාවය දොඩම් ඇටය තුළ තිබුණි. දොඩම් ඇටය ශක්‍යතාවයේ සිට තත්‍යතාවය වෙත ගමන් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දොඩම් ගස ඇතිවුණි. තත්‍යතාව දොඩම් ගසයි. (ධර්මසිරි, 2007, 109) ලෝකයේ යම් ප්‍රපඤ්චයක් නිර්මාණයවීමට බලපාන්නේ යැයි ඇරිස්ටෝටල් ඉදිරිපත් කළ හේතු අතරින් කාරක හේතුව මූල හේතුක තර්කය පෝෂණය කර ගැනීමට ඇක්වයිනාස් පියතුමා කටයුතු කළේ ය. මූල හේතුක තර්කය විවේචනය වන්නේ ලොව සෑම දෙයකට ම හේතුවක් ඇතැයි යන පූර්ව නිගමනය මත පදනම්ව කරුණු ඉදිරිපත් කිරීම හේතුවෙනි. නිගමනය ඉලක්ක කොට ගෙන තර්කයක් සෙවීම දාර්ශනික කාර්යයක් නොවේ. ලෝකයේ සියලු ද්‍රව්‍යය වස්තූන්ගේ හා ජීවයේ මූල හේතුව දෙවියන් වහන්සේ බව ඔප්පු කිරීමේ අරමුණ සහිතව ඉදිරිපත් කළ මෙම තර්කය විසංවාදී වූවකි. සියල්ලට හේතුව දෙවියන් වූව ද දෙවියන්ට හේතුවක් නොමැතිවීම ප්‍රධාන ගැටලුවකි.

සත්භාව තර්කය පළමු වරට ඉදිරිපත් කරන ලද්දේ ශාන්ත ඔගස්ටින් විසිනි. පසුව ශාන්ත ඇන්සලම් පියතුමා විසින් වඩා සකස් කොට ඉදිරිපත් කරන ලදී. (ධර්මසිරි, 1970, 110). දෙවියන් වහන්සේ සියලු ගුණයන්ගෙන් යුක්ත වන අතර පැවැත්ම යන්න ද එම ගුණයන්ට ම අයත් වූවකි. දෙවියන් වහන්සේ යැයි කියූ විට පැවැත්ම යන්න අමුතුවෙන් කිව යුත්තක් නොවේ. දේවියන් වහන්සේ යන්න පැවැත්ම යන අභිධානයෙන් යුක්ත වූවකි. එම නිසා දෙවියන් වහන්සේ නොපතීයැයි කී විට ස්වයං විසංවාදයක් හටගන්නා බව යි, මෙයින් අවධාරණය කරන්නේ. (ධම්මානන්ද හිමි, 2021,46). සද්භාව තර්කයෙන් දෙවියන් විශ්ලේශී තර්කයක් ලෙස දක්වා දෙවියන්ගේ පැවැත්ම ඔප්පු කිරීමට උත්සාහ දරා තිබුණ ද දෙවියන් වහන්සේ පවතී යන්න විශ්ලේශී තර්කයක් නොවන බැවින් එම තර්කය ද අසාර්ථක වූවක් ලෙස යි, විචාරකයන් පෙන්වා දෙන්නේ.

ලෝකයේ සිදු වන ක්‍රියාවලීන් අතර යම් ක්‍රමික බවක් ඇත. කුඩා ඒකකයේ සිට විශාලතම ඒකය දක්වා මෙය දක්නට ඇත. මෙය ස්වාභාවිකය සිදුවන්නක් නොවේ. මෙහි කාරකයකු ඇත. එම කාරකයා

සර්වබලධාරී දෙවියන් වහන්සේ බව ඔප්පු කරනු වස් සාධ්‍යතා තර්කය ඉදිරිපත් කරයි. ''පැලේ'' නම් චින්තකයා ද මෙම තර්කය ඉදිරිපත් කර ඇත. මානව ක්‍රියාකරකම්, සත්ත්ව ශරීය, ඉර නැගැගීම, ඉර බැසීම, උදෑසන, රාත්‍රී, දහවල ආදී සියල්ලක් ම යම් ඒකාකාරී රටාවකට සිදුවන්නකි. නූතන විද්‍යාව ද පිළිගන්නා ස්වාභාව ධර්මයේ ඒකරූපීතාව ද (Homogeneity) යන්න ද මෙයට කිට්ටු සාමානත්වක් දරයි. (විදානගමගේ, 2007: 152). දෙවියන් වහන්සේගේ පැවැත් ම තහවුරු කරනු වස් ඉදිරිපත් වූ තර්ක අතරින් මෙය සුවිශේෂී තර්කයක් ලෙස විචාරකයන් ද සාකච්ඡා කරයි. විදයාවේ දියුණුවත් සමග ක්‍රම ක්‍රමයෙන් සාධ්‍යතා තර්කය මගින් දෙවියන් වෙත යොමු කළ බලය ක්‍රමයෙන් ගිලිහෙන්ට විය. නූතනය වන විට සාධ්‍යතා තර්කය මගින් ඉදිරිපත් වූ කරුණු විද්‍යාත්මක ඥානය මගින් ස්වභාව සංසිද්ධීන් හා ජීවවිද්‍යාත්මක ක්‍රියාවලීන් ලෙස සාකච්ඡා කොට තිබේ.

දෙවියන් වහන්සේ පැවැත් තහවුරු කිරීම ප්‍රමුඛ දාර්ශනික කාර්යභාරය ලෙස සැලකූ මධ්‍යතනික දාර්ශනිකයෝ එම අරමුණු ඉටු කර ගැනීම සඳහා උත්සාහ දැරූහ. නමුත් දෙවියන් වහන්සේ යන්න දාර්ශනික හා තාර්කිත පදනමක සිට විග්‍රහ කරමින් ශාස්ත්‍රීය පදනමක් ඇති කිරීමට ඔවුන් දැරූ උත්සාහය අගය කළ යුත්තකි. දාර්ශනික ගැටළුවල සාකච්ඡා කෙරෙන දෙවියන් පිළිබඳ ගැටලුව තාර්කිකව හා ශාස්ත්‍රීයව ශක්තිමත් කිරීමට මධ්‍යතන යුගයේ දී උත්සාහ දරා ඇත. එය එක්තරා ආකාරයකට භක්තිය (Devotion ) යන්නට ශාස්ත්‍රීය හා තාර්කික පදනමක් සකස් කිරීමකි.

දාර්ශනික විධික්‍රමවේදයක් ලෙස බොහෝ දෙනාගේ සැලකිල්ලට පාත්‍ර නොවුණ ද මධ්‍යතන යුගයේ දර්ශනය සඳහා බලපෑ ප්‍රධානතම සාධකය ක්‍රිස්තියානි දහමයි. හෙලනික දර්ශනය පෙරටුකර ගනිමින් සම්භාව්‍ය ග්‍රීක චින්තනය අනාගතය කරා ගෙනයාමේ වාහකයෙක් ලෙස කිතු දහම ක්‍රියා කළේ ය. (දැක්ම, අරලිය විජේසුන්දර පියතුමා, සුමේධ වීරවර්ධන, ගොඩගේ, 2011, 138). මෙමගින් නව්‍ය ක්‍රිස්තියානි දර්ශනයක් (New Christian Philosophy) බිහි විය. මෙම නව්‍ය ක්‍රිස්තියානි දර්ශනයේ දාර්ශනික රීතියේ (Philosophical Method) උච්චතම අවස්ථා 12 හා 13 සියවස් කේන්ද්‍ර කර ගනිමින් පෝෂණය විය. නව්‍ය ක්‍රිස්තියානි දර්ශනය තුළ මූලික අවධානය යොමු වූ අංශ දෙකකි.

01. සාමාන්‍ය පිළිබඳ ප්‍රශ්නය (Philosophy of Universal)

02. දෙවියන්ගේ පැවැත්ම පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීම Proving the Existence of God)

මෙම කරුණු මත පදනම් ව බිහි වූ ශාස්ත්‍රීය ප්‍රවාහය ශාස්ත්‍රීයවාදය (Scholosticism) ලෙස හඳුනා ගැනේ. දේවධර්මය (Theology) කේන්ද්‍රකරගත් ක්‍රිස්තියානිය ආධිපත්‍ය දැරූ දාර්ශනික ප්‍රවාහයක් ලෙස මෙය හඳුනා ගැනේ. ඇරිස්ටෝටලියානු තර්කනය සහ මුල් ක්‍රිස්තියානි පියවරුන්ගේ ලේඛන මත පදනම්ව මධ්‍යකාලීන යුරෝපීය විශ්වවිද්‍යාලවල ඉගැන්වූ දේවධර්මය හා දර්ශනය හා සම්ප්‍රදාය හා මූලධර්මය අවධාරණය කිරීම මෙහි මූලික අදහසයි.* (https://www.lexico.com/definition/scholasticism&(accessed on 10th June 2021) මෙය ක්‍රිස්තියානි පණ්ඩිතවාදය ලෙස රසල් හඳුන්ව යි. ස්කොලාස්කවාදයේ ප්‍රථම දාර්ශනිකයා ලෙස හඳුන්වා ගන්නේ රොස්සලින් ය. (රසල්, 1970, 474) මොහු පිළිබඳ පුද්ගලික තොරතුරු එතරම් ප්‍රකට නොවේ. ත්‍රිත්වය පිළිබඳ ඔහු ලියූ ලිපියක් ශාස්ත්‍රීය ලේඛනයක් ලෙස හමුවන අතර රොස්සලින්ගේ දර්ශනය දැනගත හැක්කේ ඇන්සලම්ගේ හා අබෙලාඩ්ගේ වාදායත්ත ලිපි මගිනි. රොස්සලින්ගේ ගෝලයා වූ අබෙලාඩ් ඔහුට වඩා දක්ෂ වූවෙකි. පසු කලෙස සිය බිරිඳ සමග පූජක දිවියට යොමු වන අබෙලාඩ් හොඳ ගුරුවරයකු විය. ක්‍රිːවː 1121 - 1122 කාලය තුළ ඔහු විසින් ලියන ලද ''sic et non'' (ඔව් සහ නැහැ) වඩාත් විශිෂ්ට කෘතියක් විය. ශුද්ධ ලියවිලිවලට අමතරව සත්‍ය වෙත ගමන් කළ හැකි අනෙක් මාර්ගය අපෝහකය (Dialectic) බව ඔහු ප්‍රකාට කළේ ය. ප්‍රධාන වශයෙන් ම තර්ක විදයාව හා ඥානවිදයා සම්බන්ධයෙන් අබෙලාඩ් වැදගත් වේ. අපෝහකය මූලික කර ගනිමින් අබෙලාඩ් ගොඩනැගූ දර්ශනවාදයට ප්‍රතිවිරෝධීව ශුද්ධ බර්නාඩ් කරුණු දක්වයි. ඔහු ආගමික ධ්‍යාන යෝගියෙකි. ලෞකිකත්වය හෙළා දුටුවෙකි. කුරුස යුද්ධය අනුමත කළ තැනැත්තෙකි. ආගමික පක්ෂය දේශපාලන කිරීම හෙළ දුටු ඔහු පාප්තුමාගේ කාර්යය ආධ්‍යාත්ම විය යුතු විශ්වාස කළේ ය. බර්නාඩ්ගෙ න් පසුව ශාස්ත්‍රීයවාදය තුළ අපට හමුවන්නේ සෝල්ස්බරිහි ජෝන් නම් චින්තකයා ය. ඉතා වැදගත් චින්තකයෙකු නොවුන ද ඔහුගේ ශාස්ත්‍රීය සේවාව තුළින් තත්කාලීන තොරතුරු දත හැකි ය. ඔහු එම කාලය ගැන ඕපාදූප හැලි කෘතියක් කළේ ය. (රසල්, 1970, 479ච) මේ

අතර III ඉනොසන්ට්, ශුද්ධ ප්‍රැන්සිස්, II ප්‍රෙඩ්රික් හා ශාන්ත තොමස් ඇක්වයිනාස් ස්කොලාටික ගුරු කුලයේ වැදගත් භූමිකා වෙති. මේ අතරින් ශ්‍රේෂ්ඨතමයා ශාන්ත තෝමස් ඇක්වයිනාස් ය. දර්ශනය උගන්වන සියලු ම කතෝලික අධ්‍යාපන ආයතනවලින් සැබෑ වූ එක ම දාර්ශනය වශයෙන් එතුමාගේ දර්ශනය ඉගැවුව මනාය යන්න 1879 දි VIII ලියෝ පාප්තුමා විසින් පනවන ලද නියෝගයකින් සාමාන්‍ය රීතියව පවතී. (රසල් 1970, 492 ච) මධ්‍යතන ක්‍රිස්තියානි දර්ශනයේ ආරම්භයට බලපෑ ප්ලේටොනික ඉගැන්වීම් හේතුවෙන් ඇරිස්ටෝටල්ගේ සෙවනැල්ල නැසී තැබුණි. තෝමස් ඇක්වයිනාස් ඇරිස්ටෝටල්ගේ ඉගැන්වීම් ක්‍රිස්තියානි දර්ශනය වෙත රැගෙන ආ ප්‍රමුඛයා විය. තර්කයන් මගින් ක්‍රිස්තියානි ආගමේ සත්‍යත්වය ඔප්පු කිරීම අරමුණු කර ගත් ඇක්වයිනාස්ගේ වැදගත් ම කෘතිය ''Summa Contra Gentiles'' කෘතිය යි. මූලික වශයෙන් ඔහු තම කෘතියේ දි උත්සාහ දරා ඇත්තේ දෙවියන් වහන්සේගේ පැවැත්ම ඔප්පු කිරීමට යි. ඇරිස්ටෝටල්ගේ ඉගැන්වීම්හි එන අචාලක චාලකයා සංකල්පය ඔහුට ප්‍රධාන වශයෙන් බලපා ඇත. ඇක්වයිනාස් ඔහුගේ කෘතියේ දි සාකච්ඡා කළ මූලික කරුණු කිහිපය කි.

- දෙවියන්ගේ සත්තාව ඔප්පු කිරීම
- මවන ලද සතුන් හා මිනිස් ආත්මය පිළිබඳ සාකච්ඡා කිරීම
- ක්‍රිස්තියානි ආචාර ධර්ම පිළිබඳ සාකච්ඡා කිරීම
- දේවධාර්මිකයන් අරභයා ඔවුන්ට අදාළ කොටස් හඳුන්වා දීම

මේ සියලු කරුණු වලින් ඇක්වයිනාස් උත්සුක වූයේ දෙවියන් දාර්ශනිකකරණයකට ලක්කිරීමයි. ක්‍රිස්තියානි දර්ශනය තළ පහළවූ ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයා ලෙස මොහු සැලකිය හැකි වු ද දර්ශන ඉතිහාසයේ ඔහුට හිමිවන්නේ කුන ස්ථානයක් ද යන්න රසල්ගේ පහත නිගමනයෙන් පැහැදිලි වේ. ''කල්තබා දෙන ලද නිගමනයක් සඳහා තර්කයක් සෙවීම දර්ශනය නොව විශේෂ ආයාචනය යි. එබැවින් එතුමා ග්‍රීසියේ හෝ නූතන සමයේ ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයන් හා එක මට්ටමේලා ගිනිය යුතුයැයි මට නොසිතේ'' (රසල්, 1970, 504)

ඇක්වයිනාස් විසින් ගොඩ නැගූ දාර්ශනික ආධිපත්‍ය පිළිනොගත් පිරිසි ප්‍රැන්සිස්කන් නිකායිකයෝ වෙති. එම ගුරු කුලය

තුළ වැදගතකත් වන දාර්ශනිකයෝ කිහිප දෙනෙකි. එනම් රොජර් බෙකර්, ඕනස් ස්කෝටස්, ඔක්කම්හි විලියම්, ශුද්ධ බොනවෙන්කුරා, ඇක්වාස්පාටාර්හි මැතිව් ආදීහු එසේ ම ශාන්ත ඔගස්ටීන් හා ශාන්ත ඇන්සලම් යන දාර්ශනිකයෝ මධ්‍යතන ක්‍රිස්තියානි දර්ශනය පෝෂණය කිරීමෙහි ප්‍රමුඛයෝ වූහ. අප සාකච්ඡා කළ ක්‍රිස්තියානි දාර්ශනිකයන්ට අමතරව අරාබි හා යුදෙව් චින්තයන් ද මධ්‍යතන යුගය පෝෂණය කළේ ය. විශේෂයෙන් ග්‍රීක සාම්භාව්‍ය කෘති ක්‍රිස්තියානි දර්ශනයේ පෝෂණයට ඉමහත් සේවයක් සිදු කළේ ය.

## ක්‍රිස්තියානි දර්ශනය බිඳවැටීම

දීර්ඝ කාලයක් තිස්සේ පැවති ක්‍රිස්තියානි දාර්ශනික ආධිපත්‍ය බිඳ වැටීම ආරම්භවීමට බලපෑ සාධක කීපයකි.

- ක්‍රිස්තියානි දර්ශනියේ දුර්වලතා
- විද්‍යාත්මක ඥානයේ පිබිදීම
- දිගුකාලීන ව සිදු වූ පල්ලියේ මර්ධනකාරී කටයුතු

## නව දේශපාලන හා ආගමික පිබිදීම්

කොපනිකර්ස්, ගැලීලයෝ ගැලලි, හාර්වි, ඩෙකාට් යනාදීන්ගේ තීක්ෂණ බුද්ධි ප්‍රබෝධය පල්ලියේ ඒකාධිකාරයට ප්‍රබල පහරක් විය. වසර ගණන් තිස්සේ දෙවියන්ගෙන් අතමිදීමට නොහැකි වීම හා ඔවුන්ට අතමිදීමට නොහැකි වූ කරුණුවලට විරුද්ධ වන්නන්ට මර්දනකාරී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම ක්‍රිස්තියානි දර්ශනයේ බිඳවැටීමට රුකුලක් විය. විශේෂයෙන් කොපනිකර්ස් තම භෞතික විද්‍යාමය ඥානය මගින් පල්ලිය පිළිගත් ප්‍රධාන සත්‍යයක් අසත්‍ය ලෙස පෙන්වා දුන්නේ ය. එනම් පෘතුවි කේන්ද්‍රවාදය වෙනුවට සූර්යකේන්ද්‍රවාදය පෙන්වා දීමයි. මෙය පල්ලිය උරණ කිරීමට සමත් විය. ගැලීලියෝ ගැලලි දුරේක්ෂය නිපදවීමෙන් පසු කොපනිකස්ගේ අදහස් තවත් වේගයේ ව්‍යාප්ත විය. වතිකානු පල්ලිය ක්‍රි:ව: 1616 දි කොපනිකස්ගේ කෘති තහනම් ලයිස්තුවට ඇතුළත් කරන් ලද්දේ දේව ධර්මට විරුද්ධ මත ඇතුළත් වූ හෙයිනි. (කලංසූරිය, 1973, 12). පල්ලියේ අවවාදයට පාත්‍ර වුව ද ගැලලි කොපනිසකස්ගේ අදහස් මත තම පර්යේෂණ මෙහෙවී ය. ''නව විද්‍යාවන් දෙකක් පිළිබඳ

පර්යේෂණයක්'' කෘතිය ගැලලි 1638 දි ඕලන්දයේ ප්‍රසිද්ධ කරනුයේ පල්ලියේ තහනමට හසු නොවනු පිණිස ය. පල්ලිය මගින් ස්ථාපිත කොට තිබූ අදහස් පිළිනොගත් පිරිසට එරෙහිව පල්ලිය ක්‍රියාත්මක කළ මර්ධනය තත්කාලීන ජනසමාජය අතර කලකිරීමක් ඇති කළේ ය. එසේ කලකිරුණු පිරිස අතර නව චින්තයන් මෙන් ම සාමාන්‍ය මහ ජනතාව ද වූහ. සිවිල් සමාජය තුළ ඇති වූ කලකිරීම නිසා පල්ලියට හිමිව තිබූ දේශපාලන බලය ද ක්‍රමයෙන් වෙනස් වන්නට විය. යුරෝපයේ හා බ්‍රිතාන්‍යයේ ඇති වූ නව දේශපාලන හා ආගමික පිබිදීම් ද ඉතා වැදගත් වෙයි. ආගමික පබිදීම් මෙහි ප්‍රමුඛ විය. එයට නව දේශපාලන පිබිදීම් ද එකතු විය. එම නව ප්‍රවණාවය සාම්ප්‍රදායික ක්‍රිස්තියානි දර්ශනයේ බිඳවැටීමට ප්‍රබල බලපෑමක් එල්ල කළේ ය. මාටින් ලූතර් (ක්‍රිඃවඃ 1483- 1546) ජොන් කැල්වින් (ක්‍රිඃවඃ 1509 - 1564) ජෝන් නොක්ස් වැනි චින්තයෝ පල්ලියේ ආඥාදායකත්වයට විරුද්ධව නව පදනමකින් යුත් ක්‍රිස්තියානි දර්ශනයක් බිහි කළේ ය. එය නව රෙපරමාදුවයි. (New Protestant) රෙපරමාදු ආගමික චින්තනය බුද්ධියේ හා ඥානයේ විකසිතවීමට පදනම සකස් කළේ ය. සාම්ප්‍රදායික ක්‍රිස්තියානි දර්ශනයට විරුද්ධව ඇති වූ නව දේශපාලන හා ආගමික හා විද්‍යාත්මක පිඹිදීම නව දාර්ශනික පදනමක් සකස් කළේ ය. එහි අග්‍රඵලය නූතන බටහිර දර්ශනය යි. ''විශ්වාසය''() වෙනුවට ''සැකය'' විධික්‍රමයක් ලෙස නැවතත් දර්ශනයට ඇතුළත් විය. එය ක්‍රිස්තියානි දර්ශනයේ අවසානය මෙන් ම නව දර්ශනයක ආරම්භය විය. කෙසේ වෙතත් ක්‍රිස්තියානි දර්ශනය යනු වසර දහසක පමණ කාලයක් එක් අරමුණක් ඇති ව පැවති දර්ශනයකි. දෙවියන් වහන්සේ තහවුරු කිරීම ඔවුන්ගේ මූලික අරමුණ විය. එම අරමුණ හේතුවෙන් මධ්‍යතන ක්‍රිස්තියානි දාර්ශනිකයන් බිහි කළ ඥානය අඳුරක් ලෙස දුටුව ද දෙවියන් වහන්සේ පිළිබඳ ගැටලුව තාර්කික ව හා දාර්ශනික ව පෝෂණය කිරීමට ඔවුන් සිදු කළ සේවා ව මධ්‍යස්ථ සිතින් විමසා බැලිය යුත්තකි.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

රසල් බී. (1970). *බටහිර දර්ශන ඉතිහාසය.*, බත්තරමුල්ලඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමෙන්තුව.

පඤ්ඤාකිත්ති හිමි එච්. (2003). *පෙරදිග හා අපරදිග දර්ශන*. වැල්ලම්පිටියඃ චතුර මුද්‍රණාලය.

වීරවර්ධන සුමේධ, (2011). *දැක්ම*. අරලිය විජේසුන්දර පියතුමා. කොළඹ 10ඃ ගොඩගේ සහ සහෝදරයෝ.

ධර්මසිරි ගුණපාල, (2007). *දාර්ශනික ප්‍රශ්න*. අධ්‍යාපන ප්‍රකාශන, බත්තරමුල්ලඃ දෙපාර්තමේන්තුව.

විදානගමගේ කුලසේන, (2007). *දාර්ශනික ගැටලු*. නාරම්මලඃ කර්තෘ ප්‍රකාශන.

ධම්මානන්ද හිමි හෝමාගම, (2021). *බෞද්ධ විශ්ලේෂී දර්ශනය*. කොළඹ 10ඃ ගොඩගේ සහ සහෝදරයෝ.

කලංසූරිය ඒ.ඩී.පී, (1973). *නූතන බටහිර දර්ශනය*. බත්තරමුල්ලඃ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

කලංසූරිය ඒ.ඩී.පී, (1987). *දර්ශනය හැදින්වීමක්*. කොළඹඃ ගුණසේන සහ සමාගම.

එදිරිසිංහ දයා සහ ඥානදාස පෙරේරා, (2001). *දාර්ශනික විමර්ශන*. දෙහිවලඃ වත්මා ප්‍රකාශකයෝ.

F. Mayer,(1951). *A History of Modern Philosophy*. New York: American Book Company,

Roges,A.K,(1942). *A Students' History of Philosophy*. New york:

https://www.lexico.com/definition/middle_ages

https://www.google.com/search?q=dogmatism&rlz=1C1CHBD_enLK956LK956&oq=dogmati&aqs=chrome.2.0l3j69i57j0l6.6055j1j15&sourceid=chrome&ie=UTF-8 (accessed on 11th June 2021 )

https://www.lexico.com/definition/theism

https://www.merriam-webster.com/dictionary/theology (accessed on 11th June 2021 )